# Path to Success – Study Pack

## තෙවන පාසල් වාරය සඳහා ඉගෙනුම් අත්වැල

## ඉතිහාසය - 7 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාල - කැලණිය

**උපදේශනය හා අධීක්ෂණය**

පී.ඩී.ඉරෝෂිනී කේ. පරණගම මිය

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**

එෆ්.එච්.ජේ. පී. සිල්වා මයා

නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( අධ්‍යාපන සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**

කේ.එල් නිල්මිණි පෙරේරා මෙය - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සමාජ විද්‍යා )

**සම්පත් දායකත්වය**

- සෝමා දීගල්ල මිය - ගුරු උපදේශක (සමාජ විද්‍යා - කැලණිය කොට්ඨාසය)
- එම්.පී.උදයංගනී මිය - හුණුපිටිය බණ්ඩාරනායක ම.වි.

සියලු හිමිකම් ඇවිරිණි

# ඉතිහාසය කෙටි සටහන්

## 7 ශ්‍රේණිය - තෙවන වාරය

## යුරෝපයේ පැරණි ශිෂ්ටාචාර

### ග්‍රීක ශිෂ්ටාචාරය

උතුරින් මැසිඩෝනියාව

**පිහිටීම:-**

බටහිරින් අයෝනියන් මුහුද




නැගෙනහිරින් ඊජියන් මුහුද

දකුණින් ක්‍රීට දූපත ඇතුළු දූපත් සමූහය

➢ පැරණි ග්‍රීක ශිෂ්ටාචාරයේ දක්නට ලැබෙන ලක්ෂණ :-

- ග්‍රීක ශිෂ්ටාචාරයට අයත් විශාලම දූපත ක්‍රීට දූපත වේ.
- ග්‍රීසිය කඳුවලින් පිරි රටකි.
- අලංකාර ඔලිම්පස් කන්ද ඉතා ප්‍රසිද්ධ ය.
- කෘෂිකර්මාන්තයට යෝග්‍ය සෞම්‍ය දේශගුණයක් පවතී .
- ස්වභාවික වරායන් පිහිටා තිබීම නිසා විදේශ වෙළෙඳ කටයුතුවලට උපකාරී වේ.

➢ ග්‍රීක ශිෂ්ටාචාරයේ ආරම්භය

- ක්‍රීට දිවයින මුල්කරගෙන මිනෝවන් ශිෂ්ටාචාරය ආරම්භ වීම.
- විවිධ ගෝත්‍ර හා ජන කණ්ඩායම් පැමිණීම නිසා මිනෝවන් ශිෂ්ටාචාරය පරිහානියට පත්වීම.
- ක්‍රිස්තු පූර්ව 2000 පමණ වන විට ග්‍රීක ශිෂ්ටාචාරය ආරම්භ වීම.

## ග්‍රීක ශිෂ්ටාචාරය පාලනය

පාලනය

↓

ග්‍රීක ශිෂ්ටාචාරය ගම්

↓

නගර බිහිවීම

↓

නගර-රාජ්‍ය හා පෞර රාජ්‍යය ලෙස හැඳින්වීම

↓

නගර-රාජ්‍ය පෞර රාජ්‍යය ලෙස හැඳින්වීම

↓

ඇතැන්ස් ස්පාටා ප්‍රධාන නගර වීම

- **පෞර රාජ්‍ය වල කැපී පෙනෙන ලක්ෂණ:-**
  - භූමි ප්‍රදේශය කුඩාවීම.
  - ජනගහනය සීමිත වීම.
  - පුරවැසියන්ට පමණක් දේශපාලන අයිතිවාසිකම් ලැබීම.( ග්‍රීක පුරවැසියන් යනු අවුරුදු 18 /19 ට වැඩි පිරිමින් වේ.)





## ග්‍රීක ශිෂ්ටාචාරය

**ආර්ථිකය**

- ගොවිතැන:- තිරිඟු ,බාර්ලි , ධාන්‍ය වර්ග, මිදි , ඔලිව්
- සත්ව පාලනය :- ගවයන්, එළුවන්, බැටළුවන්
- වෙළදාම :- භාණ්ඩ ,සුවඳ විලවුන්, ලිනන් රෙදි වයින් මැටි බඳුන්

  රටවල් :- චීනය , ඉන්දියාව, ශ්‍රී ලංකාව

**ජන ජීවිතය**

- ප්‍රභූන්,සාමාන්‍ය වැසියන් ,වහල්ලු
- ආහාර ,**එළවළු** , මස්, මාළු, බාර්ලි
- නිවාස,මහල් නිවාස, මැද මිදුල සහිත නිවාස, කුඩා නිවාස

**කලා කටයුතු**

- ගෘහ නිර්මාණ
  - පාතිනන් දෙව් මැඳුර
  - විශාල
  - ගොඩනැඟිලි
- මූර්ති /ප්‍රතිමා
  - ඇතීනා දෙවඟන
  - කවපෙත්ත විසිකිරීමේ ප්‍රතිමාව
- නාට්‍ය
  - සුඛාන්ත
  - දුක්ඛාන්ත
- සාහිත්‍යය
  - ග්‍රීක වීර කාව්‍ය
  - හෝමර්
  - ඉලියඩ් සහ ඔඩිසි







අධ්‍යාපනය

- වෘත්තිකයන් → වෘත්තිකයන් දාර්ශනිකයන් කලාකරුවන් බිහි කිරීමයිආයතන
- ආයතන → ප්ලේටෝගේ ඇකඩමි හා ඇරිස්ටෝටල්ගේ ලයිසියම් ඇකඩමිය .
- දර්ශනය → සොක්‍රටීස් ප්ලේටෝ ඇරිස්ටෝටල් ග්‍රීක දාර්ශනිකයන්
- ක්‍රීඩාව → ග්‍රීසියේ ඔලිම්පික් ක්‍රීඩා ආරම්භ කිරීම, දිවීම ,මල්ලවපොර, බර ඉසිලීම, කවපෙත්ත විසිකිරීම

- ග්‍රීක ජාතික හිපොක්‍රටීස් බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා ලෙස හැඳින්වේ .
- ආකිමිඩීස් උසස් ගණිතඥයකු හා විද්‍යාඥයකු ලෙස හැඳින්වේ,

ග්‍රීක ශිෂ්ටාචාරය ලොවට උරුම වූ දායාද :-

- යුරෝපයේ දේශපාලනය සාහිත්‍යය විද්‍යාව හා කලාව බිහිවීම .
- ග්‍රීක දාර්ශනිකයන්ගේ හා චින්තකයන්ගේ ඉගැන්වීම් යුරෝපා චින්තනය වර්ධනය වීමට උපකාරී වීම.
- නූතන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ලොවට උරුම වීම ඔලිම්පික් ක්‍රීඩාව ආරම්භ වීම.



පාතිනන් දෙව්මැඳුර



පැරණි එළිමහන් රංග පීඨයක්

පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න .

1. ශිෂ්ටාචාරයට අයත් විශාලතම දූපත කුමක්ද ?
2. පැවැති පෞර රාජ්‍ය දෙකක් නම් කරන්න.
3. පෞර රාජ්‍ය වල කැපී පෙනෙන ලක්ෂණ දෙකක් නම් කරන්න.
4. දිවයින මුල්කරගෙන පැවැති ශිෂ්ටාචාරය කුමක්ද,?

5. ග්‍රීක්වරු ශ්‍රී ලංකාව හැඳින්වූ නම කුමක්ද?
6. ග්‍රීක වරුන්ගේ ප්‍රධාන වගාවක් මොනවා ද?
7. ග්‍රීක වරු වෙළෙඳ සබඳතා පැවැත් වූ ආසියාතික රටවල් නම් කරන්න.
8. ග්‍රීසියේ ප්‍රසිද්ධ දේවස්ථානයක් හා ප්‍රතිමාවක් නම් කරන්න.
9. ග්‍රීසියේ ජීවත් වූ දාර්ශනිකයන් දෙදෙනෙක් නම් කරන්න.
10. ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලොවට උරුම වූ දායාද මොනවා ද?

# රෝම ශිෂ්ටාචාරය

උතුරින් ඇල්ප්ස් කඳු

බටහිරින් මධ්‍යධරණී මුහුද




නැගෙනහිරින් අද්‍රියාතික් මුහුද

දකුණින් මධ්‍යධරණී මුහුද


- ඉතාලියේ රෝම නගරය මුල්කරගෙන රෝම ශිෂ්ටාචාරය බිහිවිය .
- රට මැදින් ඇපිනයින් කඳු වැටිය විහිදී යයි.
- එම කඳු වැටියෙන් ටයිබර් ගංගාව ආරම්භ වේ.

## රෝම ශිෂ්ටාචාරය ආරම්භ වීම පිළිබඳ මත:-

- ඉතාලියට පැමිණි ලතින්වරු රෝමය ගොඩ නැගීම.
- රොමියුලස් විසින් රෝමය ගොඩ නැගීම.
- වෙළෙඳ මධ්‍යස්ථානයක් වූ නිසා රෝමයට පැමිණි වෙනත් ජනතාව ගොඩනැගීම.



මහා නාන තටාකය



ප්‍රභූවරයෙක්

පාලන ක්‍රමය

↓

ගෝත්‍ර හෝ පවුල්

↓

රාජාණ්ඩු ක්‍රමය

↓

සමූහාණ්ඩු ක්‍රමය

↓

කොන්සල් වරුන්ට බලතල පැවරීම

↓

සෙනෙට් සභාව

↓

රෝම අධිරාජ්‍යයක් බිහි වීම

( ක්‍රිස්තු පූර්ව 27 ස්පාඤ්ඤ ප්‍රංශය එංගලන්තය අයත් වූ රටවල් වේ)

කීර්තිමත් රෝම පාලකයෝ

**ජුලියස් සීසර්**

දක්ෂ රණ ශූරයෙකි

යුක්ති ගරුකව පාලනය ගෙනගිය පාලකයෙකි

**ඔගස්ටස් සීසර්**

පළමුවන රෝම අධිරාජයාය.

මෙතුමාගේ පාලන කාලයේ කොලෝසියම් ක්‍රීඩාගාරය හා කැරකැල්ලා මහා නාන තටාකය ඉදි කළේය.



ඔගස්ටස් සීසර්

- ජෙරුසෙලම අසල බෙත්ලෙහෙම දී ජේසු තුමාගේ උත්පත්තිය සිදු විම.

**රෝමය**

- ජනජීවිතය → පවුලේ ප්‍රධානියා පියා මව පූජනීයත්වයෙන් සැලකීම
- සමාජයේ → ප්‍රභූන් සාමාන්‍ය ජනතාව හා වහලුන්
- නගර නිර්මාණය → සුඛෝපභෝගී මහල් නිවාස, ජල පහසුකම්, පාලම් තැනීම
- කලාව හා ගෘහ නිර්මාණ → ගද්‍ය පද්‍ය ග්‍රන්ථ රචනා කිරීම වර්ජිල් කතුවරයාගේ ඊනිඩ් කෘතිය කොලෝසියම ක්‍රීඩාපිටිය, පැන්තියන් දේවස්ථානය
- මූර්ති හා ප්‍රතිමා → ලෝකඩ හිස



කොලෝසියම



පැරණි රෝම පාලමක්

- රෝම ක්‍රීඩා :- රථ වාහන ධාවන තරඟ සිංහයන් වැනි සතුන් යොදාගෙන කෲර සටන්
- වෙළඳ සබඳතා :- පෙර අපර දෙදිග වෙළඳ මධ්‍යස්ථාන ලංකා,ව චීනය, ඉන්දියාව සමඟ වෙළෙඳ පැවැත්වීම.

  උදාහරණ භාතිකාභය රජු රුවන්වැලිසෑයට රෝමයෙන් පබළු ගෙන ඒම.

## රෝම ශිෂ්ටාචාරයෙන් ලොවට උරුම වූ දායාද :-

- කිතු දහම ලොව පුරා ව්‍යාප්ත වීම.
- රෝම නීතිය
- ලතින් භාෂාව
- ගෘහ නිර්මාණ ශිල්පය

අභ්‍යාසය :- හිස්තැන් පුරවන්න

1. ඉතාලි භූමියේ රට මැදින් ................................ නම් කඳුවැටියක් විහිදී යයි
2. ............................................ නමැති වීරයකු විසින් රෝමය ගොඩ නඟන ලදැයි ජනප්‍රවාදයේ සඳහන් වේ.
3. පළමුවන රෝම අධිරාජයා ............................... විය .
4. .................................... නම් වූ සුප්‍රසිද්ධ රෝම ගද්‍ය ග්‍රන්ථය රචනා කරන ලද්දේ වර්ජිල් විසිනි.
5. රුවන්වැලි සෑයට පිදීම සඳහා රෝමයෙන් පබළු ගෙන්වන ලද්දේ ...................................... රජතුමා විසිනි.

පිළිතුරු ලියන්න.

6. රෝම ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ටත්වය පෙන්වන නිර්මාණ දෙකක් සඳහන් කරන්න.
7. රෝමය පාලනය කළ කීර්තිමත් පාලකයින් දෙදෙනකු නම් කොට එම රාජ කාල වල දී සිදු වූ වැදගත් සිදුවීම් තුනක් සඳහන් කරන්න.
8. රෝම ශිෂ්ටාචාරයෙන් ලොවට උරුම වූ දායාද ලියා දක්වන්න.